ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2515/18 - 2026 නොවැම්බර් මස 18 වැනි බදාදා - 2026.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ
කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාවේ
සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ සින්නත්තම්බි කුහතීසන් මහතා අයත් වන්නා වූ ජනනායක තමිළ් තේසිය කූට්ටනි නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ආරුමුගම් ජෙගන් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, නාගලිංගම් රේගන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ආරුමුගම් ජෙගන් මහතා, කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

නාගලිංගම් රේගන්,
තේරීම්භාර නිලධාරි,
කෝරළේ පත්තු ප්‍රාදේශීය සභාව.

2026 නොවැම්බර් මස 18 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
මඩකලපුව.

EOG 11 - 0125